// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2461/43 - 2025 නොවැම්බර් මස 07 වැනි සිකුරාදා - 2025.11.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත**

6 වන වගන්තිය යටතේ වන නියෝගය

2019 අංක 19 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත මඟින් සංශෝධනය කරන ලද 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 6 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, මෙම නියෝගය මඟින්, මෙහි උපලේඛනයේ I, II සහ III වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ආනයනය කළ භාණ්ඩවල වටිනාකම මෙහි උපලේඛනයේ අනුරූප IV වන තීරුවේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට තීරණය කළ යුතු බව නියෝග කරමි.

මෙම නිවේදනය පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද මාසයට වහාම ඉක්බිතිව එළඹෙන මාසයේ පළමු දින සිට බලාත්මක වේ.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික
සංවර්ධන අමාත්‍ය.

2025 නොවැම්බර් මස 07 වැනි දින,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය,
කොළඹ 01 දී ය.

1A - PG 7356 — 403 (2025/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

උපලේඛනය

| *සංයෝජිත වර්ගීකරණ ශීර්ෂය (I)* | *සංයෝජිත වර්ගීකරණ සංකේතාංක (II)* | *විස්තරය (III)* | **කිලෝග්‍රෑම්/ කැරට් එකක වටිනාකම ඇ.එ.ජ. ඩොලර් (IV)* |
|---|---|---|---|
| **71.02** | | **වැඩ දැමූ හෝ නොදැමූ නමුත් ආරෝපනය කිරීම හෝ බැඳීම නොකළාවූ දියමන්ති** | |
| | 7102.31 | වැඩ නොදැමූ හෝ ඉරීම පමණක් කළා වූ, පැලූ හෝ හැඩයට කැපූ | කැරට් එකකට 0.25 |
| **71.03** | | **වැඩ දැමූ හෝ නොදැමූ, වර්ග කළා වූ හෝ නොකළා වූ, නමුත් අමුණා නැති සවි නොකළා වූ හෝ නොබැඳි අනගි මැණික් ගල් (දියමන්ති හැර) සහ අර්ධ - අනගි මැණික්; ප්‍රවාහනය කිරීමේ පහසුව සඳහා තාවකාලිකව සවි කළා වූ, වර්ග නොකළ, අනගි මැණික් ගල් (දියමන්ති හැර) සහ අර්ධ අනගි මැණික් වර්ග.** | |
| | | වැඩ නොදැමූ හෝ ඉරීම පමණක් කළා වූ හෝ රළු ලෙස හැඩ ගැන්වූ | |
| | 7103.10.10 | අනගි මැණික් ගල් | කිලෝ ග්‍රෑමයකට 900.00 |
| | 7103.10.20 | අර්ධ අනගි මැණික් ගල් | කිලෝ ග්‍රෑමයකට 50.00 |
| | 7103.91 | රතු කැට, සැෆායර් සහ මරකත මැණික් | කැරට් එකකට 5.00 |
| | 7103.99 | අනෙකුත් | කැරට් එකකට 0.20 |
| **71.04** | | **වැඩ දැමූ හෝ නොදැමූ වර්ග කළා වූ හෝ නොකළා වූ, නමුත් අමුණා නැති සවි නොකළා වූ හෝ නොබැඳි, සංයෝගික හෝ පිළිසකර කළ අනගි මැණික් ගල් සහ අර්ධ - අනගි මැණික් ගල් වර්ග; ප්‍රවාහනය කිරීමේ පහසුව සඳහා තාවකාලිකව සවිකළා වූ, වර්ග නොකළ, සංයෝගික හෝ පිළිසකර කළ අනගි හෝ අර්ධ - අනගි මැණික් ගල් වර්ග.** | |
| | 7104.29 | අනෙකුත් | කිලෝ ග්‍රෑමයකට 6.00 |

** සටහන*

ඇ.එ.ජ. ඩොලර් - ඇමරිකා එක්සත් ජනපද ඩොලර් හෝ එම වටිනාකමට සමාන වෙනත් ව්‍යවහාර මුදල්

EOG 11 - 0146

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.